මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| සිංහල භාෂාව හා සාහිත්‍යය | 8 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

**ශිෂ්‍යයාගේ නම :-** ..........................................................................

සැලකිය යුතුයි

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- දෙවන කොටසෙහි 01 හා 02 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- ඉරි ඇඳි පදවලට වඩාත් උචිත යෙදුම වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(01) "දැන් මිනිහගේ <u>කරල පැහිලා</u>" සේතන් මාමා උජාරු ගමනින් යන ගුණපාල දෙස බලා කීවේය.

1. වගාව සරුවෙලා 2. වයසට ගිහින්
3. දියුණුවට පත්වෙලා 4. අමාරුවට පත්වෙලා

(02) මහා වැස්සක් වැටෙන්නට <u>ඔන්න මෙන්න කියා තිබියදී</u> ඔවුහු පැලට ගොඩවූහ.

1. විනාඩි කිහිපයකට පෙර 2. පටන් ගන්නා විටම
3. ඉතා ආසන්න මොහොතේ 4. අහස කළුවර වෙද්දී

(03) රැස්වීමට පැමිණි අගමැතිතුමා <u>ආ පයින්ම ගිය බව</u> මාධ්‍යවේදීහු වාර්තා කළහ.

1. පැමිණි වහාම ගිය බව 2. පැමිණි වාහනයේම ගිය බව
3. පැමිණි ආකාරයෙන්ම ගිය බව 4. පැමිණි පිරිස සමගම ගිය බව

- නිවැරදි අක්ෂර පමණක් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(04)
1. නිශ්පාදනය, ඖෂධ, පුස්ථකාලය
2. සජ්ජායනය, විකෘති, ප්‍රවෘත්ති
3. පරිගණකය, ශබ්දය, විකාශනය
4. විනිශ්චය, ධර්මිෂ්ඨ, නිෂ්පල

(05)
1. අක්ෂි, නිරීක්ෂණය, දේශනය
2. ප්‍රදර්ශණය, කොට්ඨාසය, වෘක්ශ
3. පිළිමය, ජලාෂය, සමස්ථ
4. වර්ෂාව, නිෂ්ශබ්ද, කෘෂිකර්මය

(06) අකාරාදි පිළිවෙළට සැකසූ විට නිවැරදි පද පේළිය තෝරන්න

1. අසිත, සරත්, ගයනක, කීර්ති
2. අයිරා, හංසිකා, පද්ම, සාමා
3. අජිත්, සමන්, චන්දන, කුසල්
4. අමරා, ඉන්දිකා, ගයනි, සීතා

(07) පහත සඳහන් වාක්‍යවලින් ප්‍රාර්ථනා ක්‍රියා පදයක් නොවන්නේ

1. රටට සාමය උදාවේවා !
2. අපේ ගුරුතුමාට නිරෝගී සුවය ලැබේවා !
3. අයියා ගිය ගමන සාර්ථක වී තිබේ !
4. මේ රුදු සුළං රැළි රළ පිට නොගැටේවා !

(08) මුලින් දැක්වෙන පදයේ සමානාර්ථ පද ඇතුළත් නොවන පද පේළිය තෝරන්න.

1. ඇස් - නෙත්, නයන, අක්ෂි, නුවන්
2. හිරු - සූර්යයා, දිනිඳු, දිනකර, දිනමිණ
3. ගස - රුක, වෘක්ෂ, තුරු, ද්‍රැමය
4. මුහුද - මේඝය, ජලධර, නිශාකර, ගනකුළ

(09) මහා සිංහල ශබ්ද කෝෂයේ එන " කිරි පුබ්බරු" යන පදයේ අර්ථය කුමක්ද ?

1. කිරිබත
2. කිරි බඳුන
3. කිරි ගොටුව
4. කිරෙන් පිසූ කොස්

(10) ඉරි ඇඳි ක්‍රියා පදය අයත් වර්ගය තෝරන්න.

<u>නිදන්න පු</u>ත, රන්කිරි

1. පූර්ව ක්‍රියා
2. මිශ්‍ර ක්‍රියා
3. විධි ක්‍රියා
4. ආශිර්වාද ක්‍රියා

(11) පුතා හැම වැඩක්ම සිහියෙන් කරයි. මෙම වාක්‍යයේ ක්‍රියා විශේෂණ පදය වන්නේ

1. කරයි
2. සිහියෙන්
3. වැඩක්ම
4. හැම

(12) ඔහු <u>ගුණවත්</u> තැනැත්තෙකි. ඉරි ඇඳි පදය අයත් වන්නේ,

1. සමාස නාම
2. සර්ව නාම
3. කෘදන්ත නාම
4. තද්ධිත නාම

(13) පහත පදයට විරුද්ධාර්ථවත් පදය තෝරන්න.

සම්මාන :

1. පරිමාණ
2. නිර්මාණ
3. බහුමාන
4. අවමාන

(14) ළමයා ගොයකු <u>මෙන්</u> බඩගායි ඉරි ඇඳි පදය අයත්වන පද විශේෂය වන්නේ

1. ක්‍රියා
2. නිපාත
3. උපසර්ග
4. නාමපද

හිස් තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න

(15) ...................................... එළියෙන් නැහැවුණු පරිසරය දුටු ඔහුගේ
...................................... ප්‍රමෝදයට පත්විය (හඳ, හද)

(16) වාක්‍ය සම්පූර්ණ කිරීම සඳහා සුදුසු අතීත කාල ක්‍රියා පදය වන්නේ,

අම්මා දියණිය සමඟ නගරයට ..........................................................................................

1. යයි	2. යන්නීය

3. ගියාය	4. ගියහ.

- පහත දැක්වෙන වචන ගොනුවලට ඡත්‍ර පද (තනි පද) ලියන්න.

(17) කිසිම කාර්යයක් කඩිසරව කළ නොහැකි ......................................................................

(18) තමා කළ වැරදි තමා විසින්ම කියා පෑම ......................................................................

- හිස්තැන්වලට සුදුසු පද තෝරා යටින් ඉරක් අඳින්න.

(19) .................................. වෙහෙස මහන්සි වී කුඹුරු වැඩ කළෙහු

1. තොප	2. නුඹලා

3. තෙප	4. ඔබ

(20) උපාසිකාවෝ පොහෝ දින සිල් සමාදන් ......................................................................

1. වූහ	2. වූවාය

3. වන්නීය	4. වූවේය	(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- 01 හා 02 ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම අනිවාර්ය වේ.
- 03, 04, 05, 06, 07 ප්‍රශ්නවලින් තුනක් තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(1) ඔබ පන්ති කාමරයේදී පවත්වන ලද විවිධ ශෛලීන්ට අනුව කියවීම ඇගයීම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) විවිධ ශෛලියෙන් කියවීම සඳහා යොදාගත් ලේඛන වර්ග 02 ක් ලියා දක්වන්න. (ලකුණු 02 )

(ii) මෙම ඇගයීමේදි ඔබට ලැබුණු ගුරු උපදෙස් 02 ක් ලියා දක්වන්න. (ලකුණු 02 )

(iii) මෙම කියවීම තුළින් ඔබට ලැබුණු අත්දැකීම් 02 ක් ලියා දක්වන්න. (ලකුණු 04 )

(iv) එහිදි ඔබට ඇතිවූ ගැටලුවක් නම් කර එය මගහරවා ගත් ආකාරය ලියන්න. (ලකුණු 04 )

(v) පුරාණ සිංහල බණ කතා ලියවී ඇත්තේ කිනම් ශෛලියකට අනුවද ? (ලකුණු 04 )

(02) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න.

(i) මේ අපේ උදාර වු මාතෘ භූමියයි

(ii) ජලය අපගේ ජීවයයි

(iii) වසංගත රෝගවලින් ආරක්ෂා වෙමු.

(iv) පොත් අපේ නෙත් වගේ

(v) සියරට දේ සිරි සැප දේ	(ලකුණු 14 )

(03) (අ) මනමේ නාට්‍යය ඔබ පාසලේදී වේදිකා ගත වන බැවින් එය නැරඹීමට පැමිණෙන ලෙස දන්වා ඔබේ මිතුරාට යවන ලිපිය සකස් කරන්න.

නැතහොත්

(ආ) නගර සභාව යටතේ පාලනය වන මහජන පුස්තකාලයට සාමාජිකයන් බඳවා ගැනීම සඳහා සුදුසු ආකෘති පත්‍රයක් පිළියෙල කරන්න.

(ලකුණු 10 )

(04) පෙළපොත ඇසුරෙන් පහත දක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"ඉඳා ඉක්මනට කඩේට ගිහිල්ලා, නූල් රෝද දෙකක් අරගෙන වරෙන්"

(1) මෙසේ කීවේ කවුරුන්ද ?

(2) මෙසේ කීවේ කාහටද ?

(3) මෙම පාඨය ඇතුළත් කෙටි කතාවේ නම කුමක්ද ?

(4) එම කෙටිකතාව රචනා කළේ කවුරුන් විසින්ද ?

(5) ඔහු විසින් රචිත වෙනත් කෙටිකතා සංග්‍රහ 02 ක් ලියන්න.

(ලකුණු 2x5 =10 )

(05) හිස්තැනට සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න

(1) ප්‍රදීපයෝ වෙහෙර බිම ආලෝකමත් ....................................................... (කරයි / කරති)

(2) තරු පෙළ නිල් අහස් තලය ශෝභාමත් ............................................ (කරයි / කළහ)

(3) තෙරණුවෝ ධර්මය දේශනා ............................................................. (කළහ / කළේය)

(4) තොපි ශ්‍රමදානයට සහභාගී ............................................................ (වූවෙහි / වූවෙහු)

(5) (තෝ / තොපි) ............................................................... චාරිකාව සංවිධානය කළෙහි

(6) (කම්කරුවෝ / කම්කරුවන්) ...................................................... වෙහෙසි වැඩ කළහ.

(7) සමුද්‍ර බාදනය නිසා ගෙවල් රාශියක් මුහුදට බිලි ..................................... (විය/ වූහ)

(8) අපි චෛත්‍ය ප්‍රදක්ෂිණා .......................................................................... (කළෙමු/කළෙමි)

(9) (ඔවුහු / ඔවුන්) .................................................. වාර්ෂිකව පැවැත්වෙන දානමය පුන්‍ය කර්මය සඳහා අනුග්‍රහය (දැක්විය/ දැක්වූහ)

(10) ඔවුහු .................................... දුටුවෝ ය. (අපි / අප) (ලකුණු 1 x 10 =10 )

(06) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

බෞද්ධ පූජෝත්සව අතර කඨින පින්කමට හිමි වන්නේ විශේෂ ස්ථානයකි. කඨින යන පදය "තද", "බලගතු", "බලවත්" යන අර්ථ දෙන පදයකි. කඨින පින්කමෙන් ලැබෙන ආනිශංස අනෙකුත් පින්කම්වලින් ලැබෙන ආනිශංසවලට වඩා බලවත් ලෙස සැලකීම මේ පින්කමට "කඨින" යන නාමය ලැබීමට හේතුව ලෙස සැලකෙයි. සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම උදෙසා මෙමගින් ලැබෙන පිටුබලය අතිමහත්ය. කඨින පින්කම සිදු කෙරෙන්නේ වස් කාලය කේන්ද්‍ර කර ගනිමිනි. වස් යනුවෙන් අදහස් වන්නේ වර්ෂාවයි. වස් කාලය යනු වර්ෂා කාලය ලෙස ගැනේ. වස් කාලයේදී වස් විසීමේ චාරිත්‍රය මුලින්ම ඇතිවුනේ සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේගේ බුද්ධත්වයෙන් වසර විස්සකට පසුවය.

(1) ඉහත ඡේදයෙන් කියවෙන බෞද්ධ පූජෝත්සවය කුමක්ද ?

(2) මෙම පින්කම සිදු කරන්නේ කිනම් කාලයක් කේන්ද්‍ර කරගෙනද ?

(3) "කඨින" යන පදයෙනි අර්ථය කුමක්ද ?

(4) මෙම බෞද්ධ පූජා උත්සවය අප තුළ කිනම් සංකල්ප වර්ධනය කරගැනිම සඳහා ඉවහල් වේද ?

(5) පහත පදවල අර්ථ ලියා දක්වන්න.

ජාතිකාභිමානය -

චාරිත්‍ර - (ලකුණු 2 x 5 =10 )

(07) පහත සඳහන් කවිවලට සුදුසු ඉතිරි පද දෙක නිර්මාණය කරන්න.

(1) වනේ සා මුව රළ
බුදිමින් මියුරු පල වැල
........................................................
........................................................

(2) ඇස් අදහනු බැරිය
කඳු ගැහුණු මළ සිරුරුය
........................................................
........................................................

(3) කැත කුණු අත ගගා අප හැදූ වැඩූ අම්මා
සිඹ සිඹ නළල කළ සුරතල් නැත නිම්මා
..................................................................................
..................................................................................

(4) සඳ මුහුණයි හිනා කටයි
සිරියාවයි මිහිර මවයි
..................................................................................
..................................................................................

(5) ඇසළ සඳයි කැලුම් බෙදයි පෝදා අහසේ
බුදු සමිඳුනි මෙහි වඩින්න කාටත් රහසේ
..................................................................................
.................................................................................. (ලකුණු 2 x 5 = 10 )